# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2062/31 - 2018 මාර්තු මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2018.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 94/1947(vii)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6 (2) (ආ) සහ 21 (2) (ආ) වගන්ති යටතේ වූ නියමය

(269 වැනි අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6 (2) (ආ) වගන්තිය සහ 21 (2) (ආ) වගන්ති මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මා විසින්, මේ නියමය මගින්

(අ) ඉහත කී ආඥාපනතේ කාර්ය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ''රන්ගිරි රජමහා විහාර භූමි ප්‍රදේශය'' යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබූ ''රන්ගිරි රජමහා විහාර භූමි ප්‍රදේශය'' සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධාන කරනු ලැබේ.

පාඨලී චම්පික රණවක,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2018 ක් වූ මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

***රන්ගිරි රජමහා විහාර භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

සර්වේයර් ජනරාල්ගේ 2016 මැයි මස 16 වන දින අංක H/AMB/2016/185 දරන අනුරේඛණයේ නිරූපිත දකුණු පළාතේ, හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වලව ග්‍රාමයේ පිහිටි හෙක්ටයාර් 5.6641 ක් (අ. 13 රූ. 03 පර්. 39.42) ක විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශය :-

*මායිම් උපලේඛනය*

| | | |
|---|---|---|
| *උතුරට* | : | පියසේන හෙට්ටිහේවා විසින් හිමිකම් කියන ඉඩම, කේ. කේ. සමරරත්න විසින් හිමිකම් කියන ඉඩම, ශ්‍යාමලී අනෝමා ද සිල්වා විසින් හිමිකම් කියන ඉඩම සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස හා ගොයිගොඩ ගමගේ නිහාල් විමලසිරි විසින් හිමිකම් කියන ඉඩම ; |
| *දකුණට* | : | ප්‍රේමදාස රණවීර විසින් හිමිකම් කියන ඉඩම, සුනිල් ජිනදාස මුණසිංහ විසින් හිමිකම් කියන ඉඩම සහ මාර්ගය ; |
| *බස්නාහිරට* | : | වලවේ ගඟ. |

03 - 1322


1A - G 27300 — 32 (2018/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*